# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT

# 2016

## ඉඩම් මැනුම් සභාව

## நில அளவைச் சபை

## Land Survey Council

**ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05**
**நில அளவைகள் சபை, நில அளவையாளர் நாயக அலுவலகம், இல.150, கொழும்பு 05**
**Land Survey Council, Surveyor General’s Office,No 150, Colombo 05**

## පටුන


| | | |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ පණිවුඩය | 02 |
| 2. | දැක්ම සහ මෙහෙවර | 03 |
| 3. | ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් | 04 |
| 4. | ඉඩම් මැනුම් සභාව සතු බලතල | 05 |
| 5. | ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තාව | 05 |
| 6. | ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය | 07 |
| 7. | ක්‍රියාකාරකම් | 07 |
| 8. | අධ්‍යයන හා පුහුණු වැඩ කටයුතු | 09 |
| 9. | මූල්‍ය කළමනාකරණය | 11 |
| 10. | 2016 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශනය | 12 |

I. මූල්‍ය තත්ව ප්‍රකාශනය
II. මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය
III. ශුද්ධ වත්කම් බැරකම් ප්‍රකාශනය
IV. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
V. 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන
VI. 2016 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති

| | | |
|---|---|---|
| 11. | විගණකාධිපති වාර්තාව | 20 |

# 01. සභාපතිතුමාගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව
අංක150
බර්නාඩ් සොයිසා මාවත
නාරාහේන්පිට
කොළඹ 05
21-03-2017

ගෝලීය තරඟකාරී වෙළඳපොළ තුළ වෘත්තියෙන් උසස් මැනුම් සේවාවක් සැපයීම වස් වෘත්තීයවේදීන් ශක්තිමත් කිරිමට 2016 වසර තුළ ඉඩම් මැනුම් සභාවට හැකියාවක් ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටු වෙමි.

2002 අංක 17 දරණ මැනුම් පනත තුළින් ඉඩම් මැනුම් සභාවට පැවරී ඇති කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන වශයෙන් මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, වෘත්තීයමය මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීයමය විනය පාලනය මැනුම් සභාවේ වගකීම් වේ. එපමණක් නොව ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනයා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීමත්, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ තොරතුරු මහජනයා වෙත ලබා දීමත්, වෙනත් වෘත්තීයමය ආයතන සමග සමායෝජනය කිරීමත් ඉඩම් මැනුම් සභාවේ වගකීම් වලට අයත් ය.

මැනුම් පනතේ විධි විධානවලට අනුව ඉඩම් මැනුම් කටයුතු නියාමනය කිරීම පනත ක්‍රියාත්මක වී දශකයකටත් වැඩි කාලයක් ගත වූ පසුව හෝ 2016 වසරේදී ඒ සඳහා රෙගුලාසි සකස් කර අත්හදා බැලීමේ කාලයකට දිවයින පුරා මැනුම් කටයුතු නියාමනය සඳහා කටයුතු යොදන ලදී.

කෙටියෙන් සඳහන් කරන්නේ නම් සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුම තම වෘත්තීය කටයුතු ක්‍රමවත්ව සහ නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වා ගැනීමට උනන්දු කරවීම මෙම රෙගුලාසිවල අපේක්ෂාව විය. මිනින්දෝරු වෘත්තිය සම්බන්ධ සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය සහ කැපවීම මගින් එළිදුටු මෙම රෙගුලාසි අනුව කටයුතු කිරීම සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුට මෙන් ම පොදුවේ රටටම ප්‍රතිලාභ අත් වන්නක් බව මා තරයේ විශ්වාස කරමි. මෙම අත්හදා බැලීම් තුළින් ඉදිරිපත්වන කරුණු අනුව අදාළ රෙගුලාසි සංශෝධනය/වැඩි දියුණු කර ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ඇත.

ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය මෙන්ම වෘත්තීමය විනය පවත්වා ගැනිම උදෙසා 2016 වසරේදී ද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට අඛණ්ඩ වෘත්තිමය සංවර්ධන පුහුණු පාඨමාලා කිහිපයක් ම අනුමත කොට පැවැත්වීමට ඉඩම් මැනුම් සභාව විශේෂයෙන් කටයුතු කර ඇත. එහි දී පාඨමාලාවලට සහභාගී වීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් විසින් දක්වන ලද උනන්දුව කැපී පෙනුනි.

සමාලෝචිත කාල සීමාව තුළ ඉඩම් මැනුම් සභාව හොඳින් පවත්වා ගෙන යාම සඳහා වැඩ බලන ලේකම්, ගණකාධිකාරී (අර්ධ කාලීන) ඇතුළු සමස්ත කාර්යය මණ්ඩල මෙන්ම ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය සහ කැපවීම පිළිබඳ මාගේ ස්තූතිය පුද කරමි.

පී.එම්.පී. උදයකාන්ත
සභාපති

# 01. දැක්ම සහ මෙහෙවර

## දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛණ්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත් වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරු කර ඒ තුළින් තරඟකාරි ගෝලීය වෙළඳපොළ තුළ ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුණත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වී වෘත්තියමය පරිසරය ශක්තිමත් කිරිම මැනුම් සභාවේ දැක්ම වේ.

## මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත් වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තීයට ප්‍රවේශ වන්නන් වෙත ලැබෙන බවටත් එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරිම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

## 03. ඉඩම් මැනුම් සභාවේ කාර්යයන්

2002 අංක 17 දරන මැනුම් පනතේ සඳහන් විධි විධාන අනුව කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල තුල 2003 වර්ෂයේදි ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලදි.

ඉහත පනතේ 37 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් පහත පරිදි වේ.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්යය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.

(ඇ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහිමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරීම.

(ඈ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදි සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධන කිරීම.

(ඊ) ඉඩම් මැනීම පිළිබඳ ශාස්ත්‍රිය හා වෘත්තීමය සුදුසුකම් පිළිගැනිම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තීමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉඩම් මැනීමේ යෙදි සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනිම යන කරුණුවලදි සම තත්වයක් සහ අන්‍යොන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යොන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තිමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතින් පවත්වාගෙන යාම

## 04. ඉඩම් මැනුම් සභාව සතු බලතල

( අ ) යම් වංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

( ආ ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීමට සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම.

( ඇ ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

( ඈ ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

( ඉ ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

( ඊ ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

( උ ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සහ

( ඌ ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

## 05. 2016 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තා

### 1. ඉඩම් මැනුම් සභාවේ සංයුතිය

2002 අංක 7 දරන මැනුම් පනතේ 27 වැනි වගන්තිය අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වේ.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයින්

- i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා
- ii. උප සභපති - සර්වේයර් ජනරාල් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධූරයක් දරණ ලියාපදිංචි මිනින්දෝරු වරයෙකු
- iii. සාමාජික - 1969 අංක 21 මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ) පත්වන සාමාජිකයින්

- i. සාමාජික - 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරන මිනින්දෝරුවරුන් තිදෙනෙක්

ii. සාමාජික - 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතින් පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයකින් නම් කරණු ලබන අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂෙත්‍රයන් හි එක් විද්වතෙකු

iii. මෙම පත්කිරීම් අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.

2. 2016 **දෙසැම්බර්** 31 **දිනට අදාළව ඉඩම් මැනුම් සභාවේ සමාජිකයින් පහත දැක්වේ.**

I. පී.එම්.පී උදයකාන්ත මහතා, සභාපති
II. එස්.එම්.පි.පී. සංගක්කාර මහතා,උපසභාපති
III. එස්.කේ.විජේසිංහ මහතා, සාමාජික
IV. ආචාර්ය කේ.ආර්.එම්.යූ. බණ්ඩාර මහතා, සාමාජික
V. සී.ද.එස්. ගුණතිලක මහතා, සාමාජික
VI. එම්. කළුතන්ත්‍රි මහතා, සාමාජික
VII. ඩබ්ලිව්.ඒ.ඒ. විජේරත්න මහතා, සාමාජික

3. **සමාලෝචිත කාල සීමාව තුල සභාවේ සමාජිකයින්ගේ සේවා කාලයන්**

| | | |
|---|---|---|
| I. | පී.එම්.පී උදයකාන්ත මහතා ( සභාපති ) | - 2014.05.29 සිට |
| II. | එස්.එම්.පි.පී. සංසක්කාර මහතා ( උප සභාපති ) | - 2014.05.29 සිට |
| III. | එස්.කේ.විජේසිංහ මහතා ( සාමාජික ) | - 2016.01.25 සිට |
| IV. | ආචාර්ය කේ.ආර්.එම්.යූ බණ්ඩාර මහතා (සාමාජික) | - 2015.01.01 සිට |
| V. | සී.ද.එස්. ගුණතිලක මහතා (සාමාජික) | - 2015.01.01 සිට |
| VI. | එම්. කළුතන්ත්‍රි මහතා (සාමාජික) | - 2015.01.01 සිට |
| VII. | ඩබ්ලිව්.ඒ.ඒ. විජේරත්න මහතා ( සාමාජික) | - 2015.01.01 සිට |

4. **සභාවේ රැස්වීම් සඳහා සමාජිකයින්ගේ සහභාගිවීම්**

| | | රැස්වීම් ගණන |
|---|---|---|
| I. | පී.එම්.පී උදයකාන්ත මහතා ( සභාපති ) | - 22 |
| II. | එස්.එම්.පි.පී. සංගක්කාර මහතා ( උප සභාපති ) | - 22 |
| III. | එස්.කේ.විජේසිංහ මහතා (සාමාජික ) | - 18 |
| IV. | ආචාර්ය කේ.ආර්.එම්.යූ බණ්ඩාර මහතා (සාමාජික) | - 17 |
| V. | සී.ද.එස්. ගුණතිලක මහතා (සාමාජික) | - 13 |
| VI. | එම්. කළුතන්ත්‍රි මහතා (සාමාජික) | - 23 |
| VII. | ඩබ්ලිව්.ඒ.ඒ. විජේරත්න මහතා ( සාමාජික) | - 21 |

## 06. ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව මැනුම් සභාවේ සමාලෝචිත කාල සීමාව තුළ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

1. ජී.ඩී.එස්.කේ. ගුණරත්න මහතා - 2009.01.01 සිට 2016.12.31 දක්වා
   වැඩ බලන ලේකම්
2. රංජිත් මහකුඹුර මහතා - 2008.03.01 සිට 2016.12.31 දක්වා
   ගණකාධිකාරි ( අර්ධ කාලීන පදනම මත)
3. ඩබ්ලිව්.ඒ.එස්.ප්‍රියදර්ශනි මෙනවිය - 2004.05.24 සිට 2016.12.31 දක්වා
   පරිගණක වැඩසටහන් සහකාර / ලිපිකරු
4. ආර්.එම්.එන්.රත්නායක මහත්මිය - 2013.03.18 සිට 2016.12.31 දක්වා
   පරිගණක වැඩසටහන් සහකාර / ලිපිකරු
5. ටී.ජී.ප්‍රනාන්දු මහතා - 2004.07.15 සිට 2016.12.31 දක්වා
   කාර්යාල කාර්ය සහායක


## 07. ක්‍රියාකාරකම්

### 1. ලියාපදිංචි කිරීම

2016.12.31 දිනට ලියාපදිංචි මුළු මිනින්දෝරු සංඛ්‍යාව 2091 ක් වු අතර ඉන් 17 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුල ලියාපදිංචි කල අය විය.

### 2. වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර

සමාලෝචිත වර්ෂය තුළ වෘත්තියේ යෙදීමට වාර්ෂික බලපත්‍ර 1031 ක් ලබාගෙන ඇත. ඒ අනුව 2016 වර්ෂයේ දී 2015 වර්ෂයට වඩා වාර්ෂික බලපත්‍ර ලබා ගැනීමේ සුළු අඩුවීමක් දක්නට ඇත.




2016 ජනවාරි 31 දා දක්වා සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර 2016 මාර්තු මස 30 වන දිනැති 1960/29 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධකර පළකර ඇත.

වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ ලියාපදිංචි අංකය, මුලකුරු සමඟ නම, සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, වෘත්තීයේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය හා බලපත්‍රය වලංගු කාලසීමාව ආදි විස්තර www.survey.gov.lk වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. තව ද මෙම විස්තර ත්‍රෛමාසිකව යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ඇත.

3. **මහජනතාව වෙත තොරතුරු ලබා දීම.**

ඉඩම් මැනුම් සභාව විසින් ලබාදෙන සේවාවන් පිළිබඳ මහජනතාව දැනුවත් වී ඇති නිසා වසර සිය ගණනක් පැරණි පිඹුරු සම්බන්ධව වුවද ඒවාට සම්බන්ධ වාර්ෂික බලපත්‍ර ලාභී මිනින්දෝරුවරුන්ගේ ජීව විස්තර තොරතුරු ලබා ගැනීම සඳහා නිබඳව ම ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් බොහෝ ය. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දීම සඳහා වාර්ෂික බලපත්‍ර ලාභී සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණක ගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. හැකිතාක් දුරට මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංකද ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරු වල පිටපත් ලබා ගැනීමට දුරකථන මගින් ඔවුන් සම්බන්ධ කර ගැනීමේ පහසුකම මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද මේ දක්වා අප විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙළ කළ පැරණි පිඹුරු වල පිටපත් ලබා ගැනීමේ දී ලත් පිටුවහල ක්‍රමානුකූල නොවීම පිළිබඳ ව මැනුම් සභාව තෘප්තිමත් නොවේ. කෙසේ වුවද සමාලෝචිත කාල සීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 214 ක දී තොරතුරු ලබා දී ඇත.

4. **ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි**




අවසන් කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව

බලයලත් මිනින්දෝරුවරුන්ගේ වැඩ පිළිබඳ වෘත්තිමය විෂමාචාර වලට සම්බන්ධව 2015 වසරේ ලැබී විභාග කර අවසන් නොවූ පැමිණිලි 41 ක් සහ 2016 වසරේදි ලද පැමිණිලි 96 ක් විය. සමාලෝචිත කාල සීමාව තුල ඉඩම් මැනුම් සභාව විසින් පැමිණිලි 91 ක මූලික විමර්ශන සහ විධිමත් පරීක්ෂණ කටයුතු සිදු කර ඇත. ඒ අනුව 2016 වර්ෂයේ දී පැමිණිලි 91 ක වැඩ අවසන් කිරීමට හැකි වූ අතර වර්ෂය අවසානයේ දී පරීක්ෂණ අවසන් නොවූ පැමිණිලි සංඛ්‍යාව 46 ක් විය.

සමහර පැමිණිලිවල ස්වභාවය අනුව එනම් අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම්, ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකල නොහැකි, වැනි ගණයේ පැමිණිලි සම්බන්ධව පැමිණිලි කරුවන්ට සහනයක් ලැබෙන පරිදි අදාළ ක්‍රියාමාර්ග ගැනීමට ඉඩම් මැනුම් සභාව අපොහොසත් විය.

2016 වසරේදි ඉඩම් මැනුම් සභාව විසින් පවත්වන ලද පරීක්ෂණ අනුව 2002 අංක 17 දරණ මැනුම් පනතේ විධි විධාන යටතේ වග උත්තරකාර බලයලත් මිනින්දෝරුවරුන්ට පහත සඳහන් පරිදි බලපත්‍ර අත්හිටුවීම් හෝ ලියාපදිංචිය අවලංගු කිරීම වැනි දඩුවම් පමුණුවා ඇත.

| පැමිණිලි අංක | ලියාපදිංචි අංක | මිනින්දෝරුවරයාගේ නම | පරීක්ෂණයේ තීරණය |
|---|---|---|---|
| LSC/5/763 | 19760694 | ඒ.ජී.ඩබ්ලිව්. ගිරාගම | 2016-07-01 සිට 2017-06-30 දක්වා බලපත්‍රය අත්හිටුවන ලදී. |
| LSC/5/764 | 19790048 | ආර්.කේ.පී. රාමනායක | 2016-06-01 සිට 2017-05-31 දක්වා බලපත්‍රය අත්හිටුවන ලදී. |
| LSC/5/789 | 19920413 | ආර්.ජේ.කේ.ඒ.එම්.ආර්. ජයසේකර | 2016-06-01 සිට 2019-05-31 දක්වා ලියාපදිංචිය අත්හිටුවන ලදී. |
| LSC/5/838 | 19930835 | බී.කේ.පී. ඔකඳපොල | 2016-08-01 සිට ලියාපදිංචිය අවලංගු කරන ලදී. |
| LSC/5862 | 19770881 | ඒ.ජී.සී. සිරිසෝම | 2015-12-01 සිට 2016-05-31 දක්වා බලපත්‍රය අත්හිටුවන ලදී. |

# 08. අධ්‍යාපන හා පුහුණු වැඩ කටයුතු

## 1. අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ( CPD) පාඨමාලා

බිම් මැනීම හා සම්බන්ධව ගත්කල අඛණ්ඩව වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයකි. එබැවින් සියලුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළු වලට සහභාගි වීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් සිදු කරනු ලබයි.

### I. ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් ඔවුන් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස තම ජීවන වෘත්තියට පිවිසෙන අවස්ථාවේදී ඔවුන් සඳහා දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීම ද

ඉඩම් මැනුම් සභාව විසින් අරම්භ කර ඇත. එම පාඨමාලාවල දී සම්පත් දායකත්වය සඳහා විශාරද දැනුමක් හා පළපුරුද්දක් සහිත කිර්තිමත් ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය ඥානය සහ අවබෝධය ලබා දෙනු ඇත.

II. **වෙනත් ආයතන විසින් පවත්වනු ලැබූ අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා**


ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ ගම්පහ, බදුල්ල, මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් දක්වා ඇති උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත්වන අතර එම පාඨමාලා ඉඩම් මැනුම් සභාව විසින් පිළිගැනීමට ලක්කර ඇත.

2016 වසරේදි පවත්වා ඇති අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ආයතනය | වෘත්තීය සංවර්ධන පාඨමාලාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | Global Navigation Satellite system | 2016-02-03 |
| 2. | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | Subsequent surveys in Cadastral | 2016-02-25 |
| 3. | ඉඩම් මැනුම් සභාව | Workshop 12 | 2016-03-29 |
| 4. | ඉඩම් මැනුම් සභාව | Technical session | 2016-06-17 |
| 5. | මහනුවර බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය | Modern Surveying System | 2016-07-23 |
| 6. | මහනුවර බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය | Land and Land Administration | 2016-08-12 |
| 7. | ඉඩම් මැනුම් සභාව | Technical Session on Bimsaviya surveys and Subsequent Surveys | 2016-09-09 |
| 8. | ගම්පහ බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය | Awareness Programme on Communication and data Stovel Transfer with Modern Technology | 2016-10-14 |
| 9. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | Geographic Information System | 2016-05-06 |
| 10. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | Modern Survey Equipments and Modern Survey Techniques | 2016-10-03 |

## 09. මූල්‍ය කළමනාකරණය

### 1. ආදායම් සහ වියදම




2015/2016 මුළු ආදායම

කලින් වර්ෂයේ දී ඉඩම් මැනුම් සභාව ඉපැයූ ආදායම රු. 3,403,343.07 හා මෙම වර්ෂයේ ආදායම රු.3,817,915.84 බව ඉහත සටහන මගින් දැක්වේ. අදාළ කාලය සඳහා සභාවේ වියදම රු.4,652,345.84 කි. ඒ අනුව 2016 වසර තුළදී මුළු ආදායම ඉක්මවා වියදම් කිරීමට සිදු වූ මුදල රු.834,430.00 කි. (අලාභය)

2010,2011,2012,2013,2014 හා 2015 වර්ෂවල මෙන්ම 2016 වසරේ දී ද මහා භාණ්ඩාගාරයෙන් කිසිදු ප්‍රතිපාදනයක් ලබා දී නැත.

### 2. ප්‍රතිපාදන

ඉඩම් මැනුම් සභාවේ ආදායම ප්‍රධාන වශයෙන් වාර්ෂික බලපත්‍ර ගාස්තු ලෙස ලැබෙන මුදල්, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් වලින් ලැබෙන මුදල් සහ පරීක්ෂණවල දී වරදකරුවන් වන ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් අය කරනු ලබන පරීක්ෂණ ගාස්තු මගින් ලබයි.

2016.12.31 දිනට ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු ගිණුම් කිපයක තිබු මුදල රු.2,174,549.69 කි.

**අවසාන ගිණුම් වාර්තා**

2016 වසරට අදාළ ගිණුම් වාර්තා මේ සමග අමුණා ඇත.

එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
ඉඩම් අමාත්‍යාංශය

එස්.සිවානන්දරාජා
සභාපති
ඉඩම් මැනුම් සභාව

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

Chairman
Land Survey Council

## 11. 2016 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශනය

ඉඩම් අමාත්‍යාංශය


ඉඩම් මැනුම් සභාව

2016 දෙසැම්බර් 31 වන දිනට

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| විස්තරය | සටහන් | 2016 | | 2015 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| වත්කම් | | | | | |
| <u>ජංගම නොවන වත්කම්</u> | | | | | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1 | 1,075,549.95 | | 666,487.77 | |
| ස්ථාවර තැන්පතු | | 5,000,000.00 | | 7,383,703.47 | |
| | | | 6,075,549.95 | | 8,050,191.24 |
| | | | | | |
| <u>ජංගම වත්කම්</u> | | | | | |
| ආපදා ණය | 2 | 218,415.00 | | 127,275.00 | |
| ලැබිය යුතු දෑ | 3 | 508,000.00 | | 54,207.00 | |
| ස්ථාවර වත්කම | | 1,000,000.00 | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 4 | 2,174,549.69 | | 2,266,843.18 | |
| | | | 3,900,964.69 | | 2,448,325.18 |
| | | | | | |
| මුළු වත්කම් | | | **9,976,514.64** | | **10,498,516.42** |
| | | | | | |
| හිමිකම් සහ වගකීම් | | | | | |
| <u>ප්‍රාග්ධන සැපයුම</u> | | | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,043,030.00 | | 1,043,030.00 | |
| සමුච්චිත අරමුදල | | 6,504,170.24 | | 7,236,839.16 | |
| අතිරික්තය/හිඟය | | (834,430.00) | | (732,668.92) | |
| | | | 6,712,770.24 | | 7,547,200.24 |
| | | | | | |
| <u>ජංගම වගකීම්</u> | | | | | |
| ගෙවිය යුතු වියදම් | 5 | 291,891.57 | | 217,159.84 | |
| උපචිත වියදම් | 6 | 234,595.62 | | 128,936.63 | |
| අවිනිශ්චිත ගිනුම | | 8,819.71 | | 8,819.71 | |
| හඳුනා නොගත් කලින් ලැබීම් | | 2,728,437.50 | | 2,596,400.00 | |
| | | | 3,263,744.40 | | 2,951,316.18 |
| මුළු හිමිකම් හා වගකීම් | | | **9,976,514.64** | | **10,498,516.42** |

ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් වගකියනු ලැබේ.මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.



එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එස් .සිවානන්දරාජා
සභාපති
ඉඩම් මැනුම් සභාව

කේ.පී.ජේ.එන්.සඳමාලි
ගණකාධිකාරී(අර්ධ කාලීන)
ඉඩම් මැනුම් සභාව



එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

Chairman
Land Survey Council

Accountant
Land Survey Council

ඉඩම් මැනුම් සභාව

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධනය**

| විස්තරය | සටහන | 2016 | | 2015 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **ආදායම්** | | | | | |
| බලපත්‍ර ගාස්තුව | | 2,577,500.00 | | 2,618,750.00 | |
| ලියාපදිංචි ගාස්තුව | | 84,000.00 | | 42,000.00 | |
| පොලී ආදායම් | 7 | 539,515.81 | | 476,087.06 | |
| වෙනත් ආදායම් | 8 | 231,613.87 | | 113,377.69 | |
| වැඩමුළු ශුද්ධ ආදායම | 9 | 385,286.16 | | 153,128.32 | |
| මුළු ආදායම | | | **3,817,915.84** | | **3,403,343.07** |
| **වියදම්** | | | | | |
| <u>ආයතන හා පරිපාලන වියදම්</u> | | | | | |
| වැටුප් හා වේතන | 10 | 820,095.41 | | 804,030.90 | |
| අතිකාල හා නිවාඩු දින දීමනා | | | | 2,461.75 | |
| වෙනත් දීමනා | 11 | 2,656,616.29 | | 2,327,723.97 | |
| දේශීය ගමන් වියදම් | | 17,378.00 | | 10,796.00 | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 46,317.29 | | 136,686.86 | |
| ආහාර පාන වියදම් | | 133,726.00 | | 113,681.00 | |
| යන්ත්‍ර උපකරණ නඩත්තු වියදම් | | 10,545.00 | | 10,640.00 | |
| යන්ත්‍ර උපකරණ ගොඩනැගීමේ වියදම් | | 15,000.00 | | | |
| තැපැල් හා සන්නිවේදන | | 238,172.16 | | 134,646.79 | |
| විදුලිය හා ජලය | | 78,734.40 | | 78,734.40 | |
| වෙනත් | 12 | 486,428.47 | | 371,763.05 | |
| | | | 4,503,013.02 | | 3,991,164.72 |
| <u>මූල්‍ය හා වෙනත් වියදම්</u> | | | | | |
| ක්ෂයවීම | | 149,332.82 | | 144,847.27 | |
| මුළු වියදම් | | | 4,652,345.84 | | 4,136,011.99 |
| කාලසීමාවට අදාල අතිරික්තය/ඌනතාව | | | **(834,430.00)** | | **(732,668.92)** |

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

**2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය**

| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අරමුදල/ඌනතාවය | එකතුව |
|---|---|---|---|
| 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 6,504.170.24 | 6,504,170.24 |
| පෙර වර්ෂයේ ගැළපීම් | | - | - |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | | (834,430.00) | (834,430.00) |
| 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 5,669,740.24 | 6,712,770.24 |

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | සටහන | 2016 | | 2015 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| <u>මෙහෙයුම් කටයුතුවලින් මුදල්ප්‍රවාහ</u> | | | | | |
| අතිරික්තය/(ඌනතාවය) | | (834,430.00) | | (732,668.92) | |
| <u>මුදල් නොවන සංචලනයන්</u> | | | | | |
| ක්ෂයවීම | | 149,332.82 | | 144,847.27 | |
| ස්ථාවර තැන්පතු පොළිය | | (539,515.81) | | (476,087.06) | |
| මූලධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | | | **(390,182.99)** | | **(331,239.79)** |
| <u>මූලධන වෙනස්වීම්</u> | | | | | |
| ආපදා ණය (වැඩිවීම)/අඩුවීම | | (91,140.00) | | 95,132 | |
| උත්සව අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | | | | 3,000.00 | |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (18,793.00) | | 93,166.73 | |
| ස්ථාවර තැන්පතු (වැඩිවීම)/අඩුවීම | | (1,000,000.00) | | | |
| උපචිත වියදමෙහි (වැඩිවීම/(අඩුවීම) | | 105,658.99 | | (125,786.63) | |
| ගෙවිය යුතු වියදමෙහි (වැඩිවීම/(අඩුවීම) | | 74,731.73 | | (110,973.72) | |
| කලින් ලැබූ ආදායමෙහි වැඩිවීම/(අඩුවීම) | | 132,037.50 | | 195.150.00 | |
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | | (797,504.78) | | 149,688.38 |
| <u>ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ</u> | | | | | |
| ස්ථාවර තැන්පතු | | 2,383,703.47 | | (4,432,556.08) | |
| ස්ථාවර තැන්පතු පොළිය | | 104,515.81 | | 476,087.06 | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනිම | | (558,395.00) | | (294,316.50) | |
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | | 1,929,824.28 | | (4,250,785.52) |
| <u>මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ</u> | | | | | |
| පෙර වර්ෂයේ ගැළපීම් සමුච්චිත අරමුදල සඳහා | | | | | (30,000.00) |
| මුදල් හා මුදල් සමාන දෑ වල දළ වැඩිවීම/(අඩුවීම) | | **(92,293.49)** | | | **(5,195,005.86)** |
| කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | | 2,266,843.18 | | | 7,461,849.03 |
| කාලසීමාව අවසානයේ මුදල් හා මුදල් සමානදේ | | 2,174,549.69 | | | 2,266,843.18 |

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට අදාල සටහන්

1 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ

| අයිතම | 2016-01-01 | වර්ෂය තුළදී | එකතුව | වාර්ෂික | 2016.12.31 |
|---|---|---|---|---|---|
| | දිනට ශේෂය | මිළදී ගැනීම | | ක්ෂයවීම | දිනට |
| | රු. | රු. | රු. | රු. | ශුද්ධ වටිනාකම |
| යන්ත්‍රෝපකරණ | 233,973.63 | | 233,973.63 | 46,794.73 | ***187,178.90*** |
| ගෘහභාණ්ඩ | 187,066.26 | | 187,066.26 | 37,413.25 | ***149,653.01*** |
| පරිගණක | 98,755.31 | 127,000.00 | 225,755.31 | 29,980.50 | ***195,774.81*** |
| කාර්යාලීය උපකරණ | 28,149.19 | | 28,149.19 | 7,037.30 | ***21,111.89*** |
| ඉමැස නාම පුවරුව | 42,113.28 | | 42,113.28 | 10,528.32 | ***31,584.96*** |
| ගොඩනැගිලි හා පිරියත | 30,576.00 | 431,395.00 | 6,115.20 | 6,115.20 | **455,855.80** |
| ගිණුම් මෘදුකාංගය | 45,854.10 | | 45,854.10 | 11,463.52 | **34,390.58** |
| එකතුව | **666,487.77** | **559,395.00** | **1,224,882.77** | **149,332.82** | **1,075,549.95** |

2 ආපදා ණය

| | | |
|---|---|---|
| ඊ. ජී. ප්‍රනාන්දු | 94,755.00 | |
| ආර්.එම්.එන්.රත්නායක | 123,660.00 | |
| | | 218,415.00 |

3 ලැබිය යුතු ආදායම්

| | | |
|---|---|---|
| වැඩමුළු ආදායම | 32,000.00 | |
| පාලක මණ්ඩල දීමනා | 1,000.00 | |
| දඩ මුදල් | 40,000.00 | |
| ස්ථාවර තැන්පතු පොලී | 435,000.00 | |
| | | 508,000.00 |

4 මුදල් හා මුදල් සමාන දෑ

| | |
|---|---|
| බැංකුවේ ඇති මුදල | 424,349.69 |
| අතැති මුදල් | 200.00 |

<u>ස්ථාවර තැන්පතු</u>

| අනු අංකය | බැංකුව | කාලය | ගිණුම් අංකය | වටිනාකම | |
|---|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව, නාරාහේන්පිට | මාස 3 | 80118455 | 753,287.76 | 200,000.00 |
| 2 | ලංකා බැංකුව, නාරාහේන්පිට | මාස 6 | 80118497 | 500,000.00 | 950,000.00 |
| 3 | ලංකා බැංකුව, නාරාහේන්පිට | මාස 3 | 80118896 | 500,000.00 | 300,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 3 | 80118896 | 500,000.00 | 300,000.00 | |
| | | | | | | 2,174,549.69 |

5 ගෙවිය යුතු වියදම්

| | | |
|---|---|---|
| සභාපති දීමනා | 37,500.00 | |
| උප සභාපති දීමනා | 30,000.00 | |
| වැඩ බලන ලේකම් දීමනා | 9,632.50 | |
| ගණකාධිකාරී දීමනා | 14,341.75 | |
| විශේෂ දීමනා | 2,970.87 | |
| දුරකථන වියදම් | 3,017.45 | |
| පාලක මණ්ඩල දීමනා | 16.000.00 | |
| විගණන ගාස්තු | 178,429.00 | |
| | | 291,891.57 |

**6** උපචිත වියදම්

| අනු අංකය. | වියදම් | රු. | රු. |
|---|---|---|---|
| 1 | දුරකථන ගාස්තු | 6,338.84 | |
| 2 | පාලක කමිටු සාමාජික වියදම් | 11,000.00 | |
| 3 | පුහුණු සේවක ගාස්තු | 13,500.00 | |
| 5 | විගණන ගාස්තු | 186,321.00 | |
| | | | **217,159.84** |

7 ගෙවිය යුතු වියදම්

| | | |
|---|---|---|
| උපයන විට ගෙවීම් බදු | 2,400.00 | |
| මුද්දර බද්ද | 231,750.00 | |
| සේ.අ.අ. අරමුදල් | 356,49 | |
| සේ.භාර.කා.අරමුදල් | 89,13 | |
| | | **234,595.62** |

ස්ථාවර තැන්පතු

**7** පොලී

| අනු අංකය. | තැන්පතු අංකය | රු. | රු. |
|---|---|---|---|
| 1 | 76670842 | 12,593.37 | |
| 2 | 70070797 | 3,490.89 | |
| 3 | 7256887 | 20,970.78 | |
| 4 | 77833331 | 4,056.52 | |
| 5 | 77833540 | 3,578.16 | |
| 6 | 79135468 | 22,019.51 | |
| 7 | 78402778 | 12,234.98 | |
| 8 | 71352120 | 17,630.78 | |
| 9 | 79135075 | 7,940.82 | |
| 10 | 74890 | 68,333.33 | |
| 11 | 74891 | 366,666.67 | |
| | | | **539,515.81** |

| | | | | |
|---|---|---|---|---|
| **8** | වෙනත් ආදායම් | | | |
| | | සේවක ණය පොළී | 8,913.87 | |
| | | මිනින්දෝරු තොරතුරු සැපයීම | 43,200.00 | |
| | | පැමිණිලි ගාස්තු | 19,500.00 | |
| | | දඩ මුදල් | 160,000.00 | |
| | | | | 231,613.87 |
| **9** | වැඩමුළු ආදායම | | | |
| | ආදායම | | 1,143,000.00 | |
| | වියදම | | (757,713.84) | |
| | | | | 385,286.16 |
| **10** | වැටුප් හා වේතන | | | |
| | | වැටුප් හා වේතන | 613,160.82 | |
| | | සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව මුදල | 165,547.67 | |
| | | සේවක භාරකාරත්ව අරමුදලේ දායකත්ව මුදල | 41,386.92 | |
| | | | | **820,095.41** |
| **11** | වෙනත් දීමනා | | | |
| | | ජීවන වියදම් දීමනා | 280,800.00 | |
| | | විශේෂ දීමනා | 125,603.04 | |
| | | අන්තර් දීමනා | 360,000.00 | |
| | | පුහුණු සේවක දීමනා | 31,500.00 | |
| | | සභාපතිගේ කාර්ය දීමනා | 450,000.00 | |
| | | උප සභාපතිගේ කාර්ය දීමනා | 360,000.00 | |
| | | වැඩබලන ලේකම්වරයාගේ කාර්ය දීමනා | 115,590.00 | |
| | | ගණකාධිකාරිගේ කාර්ය දීමනා | 71,679.25 | |
| | | ඉ.මැ.ස. සාමාජික දීමනා | 739,444.00 | |
| | | විගණන කමිටු සාමාජිකයන්ගේ දීමනා | 122,000.00 | |
| | | | | **2,656,616.29** |
| | <u>සැපයුම්</u> | | | |
| **12** | වෙනත් | | | |
| | | මුද්‍රණ වියදම් | 247,492.50 | |
| | | ප්‍රචාරණ වියදම් | 39,038.70 | |
| | | සේවක පුහුණු | 74,000.00 | |
| | | ලැමිනේෂන් | 12,450.00 | |
| | | පරිවර්තන ගාස්තු | 2,082.00 | |
| | | විවිධ වියදම් | 11,365.27 | |
| | | විගණන ගාස්තු | 100,000.00 | |
| | | | | **486,428.47** |

# ඉඩම් මැනුම් සභාව
## 2016-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
## පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. <u>පොදු ගිණුම් ප්‍රතිපත්ති</u>

1.1. සැකසීමේ පදනම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට සහ 1971 අංක.38 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කරනු ලැබේ.

1.2. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කොට ඇත.

1.3. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කෙරේ.

**2.** <u>වත්කම් ඇගයීමේ පදනම</u>

2.1. ස්ථාවර වත්කම් කපාහල අගයට දක්වා ඇත.

2.2. ක්ෂය වීම
ස්ථාවර වත්කම් ක්ෂයවීම හීනවන ශේෂ ක්‍රමය යටතේ පසුගිය වර්ෂයට අනුකූලව පහත සඳහන් අනුපාතය මත සපයා ඇත.

| වත්කම් වර්ගය | % |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහ භාණ්ඩ | 10 |
| පරිගණක | 25 |
| කාර්යාලීය උපකරණ | 25 |
| නාම පුවරුව | 20 |
| ගොඩනැගිලි හා පිරියත | 20 |
| ගිණුම් මෘදුකාංගය | 10 |

# 12. විගණකාධිපති වාර්තාව - 2016

## විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඒපීඑල්/බී/එල්එස්සී/01/16/03

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 ජූනි 02 දින.

Land Survey Council
8 JUN 2017

සභාපති

ඉඩම් මැනුම් සභාව

**ඉඩම් මැනුම් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ඉඩම් මැනුම් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2017 මැයි 19 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම.

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය නිරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණක මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 45 ඡේදය ප්‍රකාරව රු.45,854 ක ගිණුම්කරණ මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් යටතේ පෙන්වා නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සේවක පාරිතෝෂික සම්බන්ධයෙන් සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර සේවක පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.547,944 ක්වූ යන්ත්‍ර, ලී බඩු, පරිගණක උපාංග හා කාර්යාල උපකරණවලට අදාල උපලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

2.2.4 අවිනිශ්චිත ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ජංගම වගකීම් යටතේ ඇතුළත් රු.8,820 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය වසර 03 ක් ගත වී ඇතත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනත. | |
| (අ) 12(1) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සකස්කර සහතික කරන ලද නිශ්චිත වර්ගවල මුල් පිඹුරු හෝ සිතියම් පිටපත් මැනුම්පති වෙත දන්න පාදකයක් පිහිටුවීම සඳහා තැන්පත් කලයුතු වුවත් ඒ අනුව ක්‍රියාකර කර නොතිබුණි. |
| (ආ) 43(1) හා (2) වගන්තිය | සභාව විසින් සියළුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරු 1031ක් සිටියද, 2016 මාර්තු 30 දින අංක 1960/29 දරන ගැසට් පත්‍රයේ 943 දෙනෙකුගේ නම් පමණක් පලකර තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍යප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.834,430 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.732,669 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.101,761 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.414,573 කින් වැඩි වුවද අනෙකුත් දීමනා රු.328,892 කින් ද තැපැල් හා සන්නිවේදන වියදම් රු.103,526 කින් හා අනෙකුත් වියදම් රු.114,665 කින් වැඩි වීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කලද 2016 වර්ෂයේ දී එය රු.834,430 ක ඌනතාවයක් බවට පත් වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2011 වර්ෂයේ දී රු.2,471,638 ක් වූ දායකත්වය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂයේ දී රු.2,791,615 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තුවන්නා වූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන්වලට එකඟවන ලෙස පුහුණුවක් හෝ අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බවටත් තහවුරු කිරීම 2002 අංක 17 දරන මැනුම් පනත ප්‍රකාරව සභාවේ අරමුණු වේ.

ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 136 ක් වුවද වර්ෂය තුල විසඳා තිබුණේ පැමිණිලි 91 ක් හෙවත් සියයට 67 ක ප්‍රමාණයක් පමණි.

(ආ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දී වෘත්තීය සංවර්ධන වැඩසටහන් 06 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද පවත්වා තිබුණේ වැඩසටහන් 03 ක් පමණි.

(ඇ) ස්වකීය නිලධාරීන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභසාධන හා ක්‍රීඩා පහසුකම් සැපයිය යුතු වුවත් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.

(ඈ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් අවශ්‍ය රීති සකස් කල යුතු වුවත් එම නියමය පරිදි ක්‍රියාකර නොතිබුණි.

(ඉ) වාර්ෂික බලපත්‍ර නිකුත් කරනු ලැබීමට හිමිකම් ඇති සෑම මිනින්දෝරුවරයකුම ඉඩම් මැනුම් පනත යටතේ ලියාපදිංචි විය යුතු බව දක්වා ඇතත්, වාර්ෂිකව බලපත්‍ර ලබා නොගෙන වෘත්තීය මිනින්දෝරු කටයුතුවල යෙදෙන පුද්ගලයින් හඳුනාගැනීමට හෝ එවන් කටයුතු තහනම් කිරීමට සභාව විසින් නීති රීති හඳුන්වා දී නොතිබුණි.

5

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සභාවේ කටයුතු ආරම්භ කළ 2005 වර්ෂයෙන් පසුව මිනින්දෝරුවරයකු සභාවේ ලියාපදිංචි වීමේදී අයකරනු ලබන රු.3,500 ක් වූ ලියාපදිංචි ගාස්තුව හා 2010 වර්ෂයෙන් පසුව වාර්ෂික බලපත්‍ර වෙනුවෙන් මිනින්දෝරුවරයකුගෙන් අයකරනු ලබන රු.2,500 ක් වූ ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංශෝධනය කර නොතිබුණි.

4.3 මහභේදයට තුඩුදෙන ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේ කාර්යාල ඉඩ පහසුකම් පුළුල් කිරීම සඳහා කාමර බෙදා වෙන් කිරීමට අදාල කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු. 138,582 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම කාර්යය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිපාටියෙන් බැහැරව කර තිබූ අතර ලංසු විවෘත කළ දිනය ලෙස 2016 අගෝස්තු 20 (සෙනසුරාදා) ලෙස ව්‍යාජ දිනයක් යොදා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් වියදම් සත්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් ශීර්ෂ 03 ක හා වැය විෂයයන් 07 ක සියයට 21 සිට සියයට 247 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර එම තනතුරට නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසට 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝගකර තිබුණද එම තනතුර පිරවීමට විගණන දිනය වූ 2017 මාර්තු 31 දක්වාම කටයුතුකර නොතිබුණි.

5.3 සමාජ වගකීම් ඉටුකිරීම

බලයලත් මිනින්දෝරුවරුන් විසින් මැනුම්කර සකස් කරන පිඹුරු මහජනතාවට ලබාගැනීමට හැකිවන පරිදි ඒවායේ පිටපත් මැනුම් සභාවට එවිය යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.

6

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | නිසි පරිදි ලෙජර් ගිණුම් පවත්වාගෙන නොයෑම හේතුවෙන් ගිණුම්වල අවිනිශ්චිත ශේෂයක් පැවතීම. |
| (ආ) ප්‍රසම්පාදන පරිපාලනය | ප්‍රසම්පාදන කටයුතු වඩා විනිවිදභාවයකින් යුක්තව සිදු නොකිරීම. |
| (ඇ) ආදායම් පාලනය | ගාස්තු සංශෝධනය කර නොතිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති